# විදේශ කටයුතු විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය

## මාධ්‍ය නිවේදනය

## ඩෙල්ෆ්ට් දූපත ශ්‍රී ලංකාවේ ප්‍රථම ආදර්ශමත් Zero Emission පරිසර හිතකාමී සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීමට රජයේ අවධානය

සුවිශේෂී ස්වභාවික, ඓතිහාසික හා සංස්කෘතික උරුමයන්ගෙන් අනූන ඩෙල්ෆ්ට් දූපත ශ්‍රී ලංකාවේ ප්‍රථම **Zero Emission (ශූන්‍ය විමෝචන)** පරිසර හිතකාමී සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ඉදිරි වැඩපිළිවෙළ පිළිබඳ විමර්ශන චාරිකාවක් සහ විශේෂ සාකච්ඡාවක් සංචාරක නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය රුවන් රණසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් අද ඩෙල්ෆ්ට් දූපතේදී පැවැත්විණි.

ඕලන්ද යුගයට අයත් නටබුන්, විවිධ පුරාවිද්‍යාත්මක ස්මාරක සහ නිදහසේ සැරිසරන වන අශ්වයන් (Wild Horses) හේතුවෙන් දේශීය හා විදේශීය සංචාරකයන් අතර සුවිශේෂී ආකර්ෂණයක් දිනාගත් ඩෙල්ෆ්ට් දූපත, එහි අනන්‍යතාව හා පාරිසරික වටිනාකම් සුරකිමින් තිරසාර සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කර ශ්‍රී ලංකාවේ ආදර්ශමත් පරිසර හිතකාමී සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

මෙහිදී අදහස් දැක්වූ සංචාරක නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය රුවන් රණසිංහ මහතා සඳහන් කළේ, ඩෙල්ෆ්ට් දූපත විදේශීය සංචාරකයන්ට පමණක් නොව දේශීය සංචාරකයන්ටද අත්විඳිය යුතු සුවිශේෂී ගමනාන්තයක් වුවද, මේ දක්වා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට එහි දායකත්වය අපේක්ෂිත මට්ටමට ළඟා වී නොමැති බවයි.

එම තත්ත්වය වෙනස් කරමින් ඩෙල්ෆ්ට් දූපත ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳව ද මෙහිදී පුළුල් ලෙස සාකච්ඡා කෙරිණි. ඒ අනුව පානීය ජල පහසුකම්, මාර්ග හා ප්‍රවාහන පහසුකම්, සංචාරකයන් සඳහා ප්‍රවේශ පහසුකම් සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙන්ම, ප්‍රදේශවාසීන්ගේ සංචාරක සත්කාරකත්වය, ආගන්තුක සේවා හා ප්‍රජා මූලික සංචාරක ව්‍යාපාර පිළිබඳ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව ද අවධානය යොමු කෙරිණි.

විශේෂයෙන්ම පරිසර සංරක්ෂණය, පුනර්ජනනීය බලශක්තිය භාවිතය, අපද්‍රව්‍ය කළමනාකරණය සහ අඩු කාබන් විමෝචනය මූලික කරගත් **Zero Emission** සංචාරක ගමනාන්තයක් ලෙස ඩෙල්ෆ්ට් දූපත සංවර්ධනය කිරීම වත්මන් රජයේ ප්‍රමුඛ සංචාරක සංවර්ධන අරමුණක් බවද නියෝජ්‍ය අමාත්‍යවරයා අවධාරණය කළේය.

මෙම අවස්ථාවට යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඉලංකුමාරන් කරුණානාදන් මහතා, ආචාර්ය ශ්‍රීභවනාදරාජා ශන්මුගනාදන් මහතා, රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා, ප්‍රාදේශීය දේශපාලන නියෝජිතයින්, ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය ලේකම්තුමා, අදාළ රාජ්‍ය ආයතනවල නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් සහභාගි වී සංචාරක සංවර්ධනය පිළිබඳ සිය අදහස් හා යෝජනා ඉදිරිපත් කළහ.

එමෙන්ම, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ (SLTPB) නිලධාරීහු ද මෙම විමර්ශන චාරිකාව සහ සාකච්ඡාව සඳහා සහභාගි වූහ.

ඩෙල්ෆ්ට් දූපතේ ස්වභාවික, ඓතිහාසික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරමින් එය ශ්‍රී ලංකාවේ ප්‍රථම ආදර්ශමත් Zero Emission පරිසර හිතකාමී සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම සඳහා අදාළ සියලු රාජ්‍ය ආයතන, ප්‍රාදේශීය බලධාරීන් සහ ප්‍රදේශවාසීන්ගේ සහයෝගය ඇතිව කඩිනමින් ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**Media Team,**
**Sri Lanka Tourism**

**2026/08/04** **යොමු අංකය: MOT/DMO/PR/M2**